**2022 අප්‍රේල් මස 22 වන දින පැවැති ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව**

**කමිටු සාමාජිකයන්**

1. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. දුමින්දු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ඩබ්.ජී.සි.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නොපැමිනිම**

1. දුමින්දු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. ඩබ්.ජී.සි.කේ.ප්‍රභාත් කිර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
3. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
4. ජී.වි.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
5. එරික් ප්‍රසන්න මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
6. එන්.ඩී.කුලතුංග මහතා - මහජන සෞඛ්‍ය පරික්ෂක
7. එම්.ජී.සි.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
8. එස්.අයි.සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි(පාලන)
9. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
10. ආර්.එම්.ආර්.රාජපක්ෂ මෙනවිය - සංවර්ධන නිලධාරි (සැළසුම්)
11. රංජිත් හෙට්ටිආරච්චි මහතා - ක්‍රීඩා නිලධාරි
12. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
13. ඩී.එම්.අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
14. ඩී.එම්.අරුණ රන්දෙනිගම මහතා - ආරක්ෂක අධික්ෂණ නිලධාරි (වැ.බ.)
15. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණිම**

1. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
3. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
4. එරික් පි මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි

5. එම්.ජී.සී.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරීක්ෂක
6. ඩී.එම්.අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
7. ඩී.එම්.අරුණ රන්දෙනිගම මහතා - ආරක්ෂක අධීක්ෂණ නිලධාරි (වැ.බ.)

1. අනුරාධපුර,ඉසුරුපුර,නිදහස් මාවත,පියුමල් නිවස,කවිදු ඉමල්ෂා පුෂ්පකුමාර මහතා විසින් ලිපියක් යොමු කරමින් 'SHIELD F POWER' යෞවන සමාජයට ක්‍රීඩා කිරීමට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   කොට්ඨාශයකට අනුමත රු.15,000.00 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ ලබාදීමට තීරණය විය. (වගකීම - සැළසුම් අංශ ප්‍රධානි)

2. අනුරාධපුර,255 තුලාන,දිවුල්ගහ පිට්ටනිය,වොරියර්ස් ක්‍රීඩා සමාජයේ ලේකම් විසින් ලිපියක් යොමු කරමින් දිවුල් ගහ පිට්ටනිය ක්‍රීඩාංගනයේ තණ තීරුව හා ක්‍රීඩා පිටිය සකසා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   මෙම ක්‍රීඩා පිටිය සකස් කිරීමට ක්‍රීඩා නිලධාරි වෙත යොමු කිරීමට තීරණය විය.(වගකීම - නාගරික ඉංජිනේරු)

3. ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ 2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරි සැළසුමේ සිංහල අවුරුදු උත්සවය සංවිධානය කිරීම සැප්තැම්බර් මස සහ භක්ති ගීත තරගාවලිය සහ නගර සභා වෙසක් උත්සවය සංවිධානය කිරීම අගෝස්තු මස ලෙස සඳහන් වී ඇති හෙයින්, එය සිංහල අවුරුදු උත්සවය අප්‍රේල් මස සහ භක්ති ගීත තරගාවලිය සහ නගර සභා වෙසක් උත්සවය මැයි මස ලෙස සංශෝධනය වියයුතු බව තීරණය විය. (වගකීම - සැළසුම් අංශ ප්‍රධානි)

4. කැබිනට් වෙළඳ ගරු අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමාගේ මුදල් ප්‍රතිපාදන මත නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරන මැතිතුමාගේ යෝජනාවකට අනුව ස්වභා උයනේ විදුලි ආලෝක සඳහා රුපියල් 900,000.00 ක් හා ඇවිදින මංතිරු පිළියල කිරීම සඳහා රුපියල් 1,850,000.00 ක මුදලක් වෙන් කර ඇත. දෙස් විදෙස් සංචාරක ආකර්ශනීය ස්ථානයක් බවට පත්කිරීමේ අරමුණ ඇතිව මෙහි වැඩ නිමකර ඇති බැවින් ස්වභා උයන ඇතුලත ශ්‍රමදාන කටයුත්තක් සඳහා යටිතල පහසුකම්,නිවාස,පුස්තකාල,තොරතුරු තාක්ෂණ හා පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ සහයෝගයෙන් සිවිල් සංවිධාන හා අනෙකුත් සහයෝගය දක්වන ආයතන එකතුව් කිරීමට බලාපොරොත්තු වන ශ්‍රමදාන කටයුතු සඳහා ගරු නගරාධිපතිතුමාගේ උපදෙස් පරිදි මහා නගර සභාවේ සේවකයන් ද යොදවා 2022 මැයි මස 21 වන දින මෙම කටයුත්ත කිරීමට තීරණය කර ඇත. (වගකීම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

5. අනුරාධපුර මහා නගර සභාව විසින් පළකරනු ලබන සෝනියර් එක 2022.05.25 වන දින ගරු නගරාධිපතිතුමාගේ උපදෙස් පරිදි පළකිරීමට කමිටුව තීරණය කරන ලදි.

6. 2022 වෙසක් කලාපය සඳහා නාගරික මන්ත්‍රී මණ්ඩලය සහ ආයතන කාර්ය මණ්ඩලය සහභාගිත්වයෙන් භක්ති ගීත කණ්ඩායම් ඉදිරිපත් කිරිම හා ආයතන අතර වෙසක් කූඩු තරඟවලියක් පැවැත්විමට යෝජනා විය. මේ සඳහා ත්‍යාග මුදලක් ලබාදිමට ද තීරණය විය. (එදින එම ස්ථානයේ ඔසු පැන් දන්සලක් ද පැවැත්වේ.)

| වෙසක් කූඩු තරඟය සඳහා | | | භක්ති ගීත තරඟය සඳහා | | |
|---|---|---|---|---|---|
| පළමු ත්‍යාගය | - | රු.20,000.00 | පළමු ත්‍යාගය | - | රු.20,000.00 |
| දෙවන ත්‍යාගය | - | රු.15,000.00 | දෙවන ත්‍යාගය | - | රු.15,000.00 |
| තුන් වන ත්‍යාගය | - | රු.10,000.00 | තුන් වන ත්‍යාගය | - | රු.10,000.00 |

7. අනුරාධපුර,3 වන පියවර,සිරිමෙවන් මිතුරු සවිය සුභසාධක සංගමය,ලේකම් විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මෙම සංගමය සඳහා ක්‍රීඩා උපකරණ (ක්‍රිකට් උපකරණ) ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම. ක්‍රීඩා කමිටුව මගින් අනුමත රු.15,000.00 ක් වටිනා ක්‍රීඩා උපකරණ ලබා ගැනිම සඳහා සිරිමෙවන් මිතුරු සවිය සුභ සාධක සංගමයට ලබාදීමට තීරණය විය. (කමිටු ප්‍රතිපාදන) (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

8. අනුරාධපුර,3 වන පියවර,සිරි පැරකුම් ප්‍රජා මණ්ඩලය,සභාපති විසින් ලිපියක් ඉදිරිපත් කරමින් සිරි පැරකුම් ප්‍රජා මණ්ඩලය මගින් ක්‍රීඩා තරඟයක් පැවැත්විමට රු.35,000.00 ක මුදලක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   මෙම කමිටුව මගින් කොට්ඨාශයේ ක්‍රීඩා තරඟාවලිය සඳහා අනුමත රු.35,000.00 ක මුදල සිරි පැරකුම් ප්‍රජා මණ්ඩල සමිතිය වෙත ලබාදිමට තීරණය විය. (කමිටු ප්‍රතිපාදන) (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

9. අනුරාධපුර,ඉසුරුපුර,නිදහස් මාවත,පොඩි වැව ළමා උද්‍යාන පාර,අයි.කේ.උලුවඩුගේ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් පොඩි වැව ප්‍රතිසංස්කරණය කිරිමේදි ඒ ආශ්‍රිතව තිබූ සෙල්ලම් ඔන්චිලි,ලිස්සන ලෑලි,ලැඩර් හා මැරිගෝ රවුන්ඩ් මහා නගර සභාව විසින් ගලවා ගෙන ගොස් ඇති බව සඳහන් කර ඇත. එබැවින් දැනට වැව ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් ඇති බැවින් එම දරුවන්ගේ සෙල්ලම් උපකරණ නැවත සවිකර දෙන ලෙස කර ඇති ඉල්ලීම.මෙම ඉල්ලීම පිළිබඳ වාර්තාවක් ලබා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

10. 2022 වර්ෂයේ අවුරුදු උත්සවයදී ඉතිරිවූ ත්‍යාග භාණ්ඩවල වටිනාකම රුපියල් 20.000.00 ක් පමන වේ. එම ඉතිරි ත්‍යාග භාණ්ඩ නාගරික ගණකාධිකාරි වෙත භාරදී ඇත. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

11. 2022 වර්ෂයේ අවුරුදු උත්සවය සඳහා යෝජිත ක්‍රීඩා හා දළ වියදම් ඇස්තමේන්තුව ඉදිරිපත් කිරිම. (ඇමුණුම 01) (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

12. 2022 වර්ෂයේ අවුරුදු උත්සවයේ දී පැවැත්වීමට තිබූ රාත්‍රී සංගීත ප්‍රසංගය සඳහා අත්තිකාරම් මුදල රුපියල් 50,000.00 ක් ලබා දී ඇත. රට තුල පැවති අයහපත් වාතාරණය හමුවේ එදින සංගීත රාත්‍රිය නොපැවැත්විම හේතුවෙන් අත්තිකාරම් මුදල නැවත ගෙවිමට අප විසින් ඔහුට දැනුම් දුන්පසු ඔහු පැවසුවේ එදින උදැසන සංගීත භාණ්ඩ ගෙනවිත් තිබූ බැවින්, එම උපකරණ නැවත රැගෙන යාමට සිදුවූ බවය. ඒ සඳහා එම මුදල් වැය වූ බව පවසන ලදි. (රුපියල් 50,000.00 ක මුදල අනුග්‍රාහක දායකත්වයකි). (ඇමුණුම 02)

<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

- උතුරු මැද පළාත් වාණිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලය,අධ්‍යාක්ෂක ජනරාල්,පී.බී.දිසානායක මහතා විසින් ලිපියක් යොමු කරමින් මහජන ක්‍රීඩාංගණය පිටුපස බදුදීමට නියමිත මහා නගර සභාව සතු “සිටි ක්ලබ්” ව්‍යාපෘතිය සඳහා විරෝධය පළකිරිමට අදාල ලිපිය සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිම.
- අනුරාධපුර,2 වන පියවර,බුද්ධගයා මාවත,අංක:949,මේඝවන විහාරය,ගරු විහාරාධිපති,ශාස්ත්‍රපති,පූජ්‍ය නෙළුවේ ජනානන්ද ස්ථවිර හිමි විසින් ලිපියක් යොමු කරමින් එම විහාරස්ථානයේ ඉදිකර ඇති බහු කාර්යය ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරිමට රු.50,000.00 ක මුදලක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිම..

| | |
|---|---|
| කොට්ඨාශය ප්‍රතිපාදන මගින් ආගමික කටයුත්තක් සඳහා වෙන් කිරිම | - රු.25,000.00 |
| කමිටු ප්‍රතිපාදන මගින් වෙන් කිරිම | - <u>රු.25,000.00</u> |
| මුළු මුදල | - <u>රු.50,000.00</u> |

- අනුරාධපුර,රත්නායකපුර,2 වන පියවර,අංක:523/33,අජිත් ෆෝටෝ සෙන්ටර්,අජිත් කරුණාරත්න මහතා විසින් ලිපියක් හා ලදුපතක් යොමු කරමින් මහා නගර සභා ක්‍රිකට් තරඟාවලිය ඡායාරූප ගත කිරිම වෙනුවෙන් වැය වූ රු.8,800.00 ක මුදල ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිම.

- ගරු නාගරික මන්ත්‍රී ජේ.එම්.සමන් ජයවර්ධන මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් ඉසුරුමුනිය කොට්ඨාශයේ 295, 295/ඒ, 296 හා 297 තුලානවල ක්‍රිකට් තරඟාවලියක් පැවැත්විම සඳහා ක්‍රීඩා කමිටුව මගින් ලබා දෙන රු.25,000.00 ක මුදලකට යටත්ව ක්‍රීඩා භාණ්ඩ ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳ තීරණයක් ලබා ගැනිම.

  මෙම කමිටුව මගින් වෙන් කරන ලද මුදලින් රු.10,000.00 ක මුදලක් ගෙවිම සඳහා අනුමැතියට ලබා ගැනිම.

- ගරු නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරන මැතිතුමා විසින් ලිපියක් යොමු කරමින් නගර සභාවෙන් නාගරික ජනතාව වෙත සපයනු ලබන සේවා හා පහසුකම් පිළිබඳ දැනුවත් කිරිමේ මාර්ගයක් වශයෙන් පුවත්පතක් එළි දැක්විමට කරන ලද යෝජනා සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිම.

- ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම් සුපිනි සඳමාලි මැතිතුමිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 250 නුවර වැව කොට්ඨාශයේ ක්‍රීඩා වැඩසටහන සඳහා වෙන් කර ඇති රු.50,000.00 ක මුදල නුවර වැව ප්‍රජා මණ්ඩලය වෙත ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳ තීරණයක් ලබා ගැනිම. ප්‍රජා මණ්ඩලය හරහා මෙම ක්‍රීඩා තරඟ පවත්වන බව සඳහන් කර ඇත.

- කොට්ඨාශ 14 සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාදිම වෙනුවෙන් වෙන් කල මුදල රු.15,000.00 වන බැවින් අනෙකුත් නාගරික මන්ත්‍රීවරුන්ගේ ඉල්ලිම පරිදි නාගරික මන්ත්‍රීවරු 14 දෙනා සඳහා ද රු.15,000.00 ක මුදලක් ක්‍රීඩා භාණ්ඩ ලබා දිම සඳහා වෙන් කරන ලදි.

- සැළසුම් අංශය විසින් යොමු කරන ලද 2022 වර්ෂයේ අවුරුදු උත්සවයේ වියදම් වාර්තාව අනුමත කිරිමට තීරණයක් ලබා ගැනිම.

| අනු අංකය | තරඟ විස්තර | ඇස්තමේන්තු මුදල | වියදම් මුදල |
|---|---|---|---|
| 1 | ග්‍රීස් ගහේ නැගීම | 200,00.00 | 30,000.00 |
| 2 | කණා මුට්ටිය බිදිම | | 3,000.00 |
| 3 | කඹ ඇදිම ( විවෘත) පිරිමි | | 30,000.00 |
| 4 | කඹ ඇදිම ( විවෘත) කාන්තා | | 30,000.00 |
| 5 | මීටර් 50 දිවීම - කාන්තා (නගර සභා) | | 6,000.00 |
| 6 | මීටර් 100 දිවීම - පිරිමි (නගර සභා) | | 6,000.00 |
| 7 | නිවේදන කටයුතු | | 15,000.00 |
| 8 | රජරට සේවය | | 40,000.00 |
| 9 | දිවා ආහාර සඳහා අත්තිකාරම් | | 30,000.00 |
| 10 | වෙක්පත් ආකෘති මුද්‍රණය මිරර් ඇඩ්වර්ටයිසිං | | 75000.00 |
| 11 | සංග්‍රහ වියදම් | | 2,500.00 |
| | **එකතුව** | **200,000.00** | **200,000.00** |

ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා,
නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,
ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව,
අනුරාධපුර.